**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## සසප/ ලෝසවෙඅ ගිම්හාන පාසල 2005

# තෙවැනි දේශනය: බොල්ශෙවික්වාදයේ සම්භවය හා "කල යුත්තේ කුමක් ද?"

## හතරවන කොටස

**Lecture three:The origins of Bolshevism and What Is To Be Done? Part-4**

**ඩේවිඩ් නෝත් විසිනි**

**2005 සැප්තැම්බර් 09**

*2005 අගෝස්තු මස 14 වන දා සිට 20 වන දා දක්වා මිචිගන්හි ඈන් ආබර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ /ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "බොල්ශෙවික්වාදයේ සම්භවය හා කල යුත්තේ කුමක් ද?" යන දේශනයේ සිව් වන කොටස යි මේ. මේ දේශනය කොටස් හතකින් පල කෙරේ. පලමු කොටස් තුන 2006 මාර්තු 24, 28, සහ 30 දිනයන්හි පල කර ඇත. ලේඛනාගාරයට පිවිස එම ලිපි බා ගත හැක. මෙය පාසැලෙහි පැවැත්වුනු තෙවැනි දේශනය යි.*

ලෙනින්ගේ පොත් පිංච ආරම්භ කෙරෙන්නේ, එඩුවාඩ් බර්න්ස්ටයින්ගේ රුසියානු අනුගාමිකයින් එනම් ආර්ථිකවාදීන් විසින් මතු කර තුබූ "විවේචනයේ නිදහස" පිලිබඳ ඉල්ලීම විමසා බලමිනි. බැලූ බැල්මට කැපී පෙනෙනසුලු තරමට ප්‍රජාතන්ත්‍රවාදී හා ආකර්ශනීය වන මෙම සටන් පාඨය ඔහු ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ විවිධ කොටස් අතර ඇවිල ගිය මතභේදයේ - එනම්, සම්මතධාරී මාක්ස්වාදයේ ආරක්ෂකයින් හා එම සම්මතධාරීත්වයට එරෙහිව ක්‍රමානුකූලව න්‍යායික හා දේශපාලනික ප්‍රහාර එල්ල කිරීමෙහි යෙදී සිටි සංශෝධනවාදීන් ද අතර මතභේදයේ - සන්දර්භය තුල බහා ලයි.

ප්‍රන්ස සමාජවාදියෙකු වූ ඇලෙක්සැන්ඩර් මිලරන්ඩ්, ජනාධිපති වල්ඩෙක් රූසෝගේ ආන්ඩුවට ඇතුලු වීම වූකලි, ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ක්‍රියාමාර්ගික පදනම් පිලිබඳ බර්න්ස්ටයින්ගේ න්‍යායික සංශෝධනයන්හි තාර්කික දේශපාලන ප්‍රකාශනය බැව් සටහන් කරමින් "'විවේචනයේ නිදහස' පිලිබඳ සටන් පාඨයෙහි අර්ථය සමාජ ප්‍රජාතන්ත්‍රවාදය තුල අවස්ථාවාදී ප්‍රවනතාවක් සඳහා නිදහස ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිසංස්කරනයේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බවට පරිවර්තනය කිරීමේ නිදහස, ධනේශ්වර සංකල්ප සහ මූලද්‍රව්‍යය සමාජවාදය තුලට හඳුන්වා දීමේ නිදහස" (8) බව ලෙනින් ප්‍රකාශ කරයි.

විවේචනය සඳහා සංශෝධනවාදීන්ට ඇති අයිතිය කිසිවෙකු ප්‍රතික්ෂේප නොකරන බව මෙම ඉල්ලීමට පිලිතුරු දෙමින් ලෙනින් පවසයි. එහෙත් ඔවුන්ගේ විවේචන ප්‍රතික්ෂේප කිරීමට හා විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රය ප්‍රතිසංස්කරනවාදී ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රයත්නයට එරෙහිව සටන් වැදීමට මාක්ස්වාදීන්ට ඊට නොඅඩු අයිතියක් ඇති බැව් ඔහු තරයේ කියා සිටියි.

රුසියාවේ ආර්ථිකවාදී ප්‍රවනතාවෙහි සම්භවය පිලිබඳව කෙටි විමසීමකින් පසු, න්‍යාය පිලිබඳ තීරනාත්මක ප්‍රශ්න කෙරෙහි එය පොදුවේ දක්වන නොසැලකිල්ල පිලිබඳව ලෙනින් සටහන් කරයි. ඔහු සඳහන් කරන්නේ ආර්ථිකවාදීන් "එතරම් පාරට්ටු කරන විවේචනයේ නිදහස මගින් අදහස් කරන්නේ, එක් න්‍යායක් වෙනුවට අනෙකක් ආදේශ කිරීම නොව;" "සමස්ත හා සැලකිල්ලට භාජනය වූ න්‍යායෙන් නිදහස් වීමකි; ඉන් අදහස් කෙරෙන්නේ "සාරසංග්‍රහවාදය සහ ප්‍රතිපත්ති විරහිත බව" (9) යන ක්‍රියාමාර්ගයන් දුසිමකට වඩා "සමාජවාදී ව්‍යාපාරයේ සැබෑ ප්‍රායෝගික ජයග්‍රහනයන්, වටනේ ය." යන මාක්ස්ගේ ප්‍රකාශය, මෙම න්‍යායික නොතැකීම සුජාතකරනය සඳහා එහි අන්තර්ගතයෙන් උගුලුවා සංශෝධනවාදීන් විසින් භාවිත කෙරෙන බව ලෙනින් නිරීක්ෂනය කරයි. "න්‍යායික වියවුල්භාවයේ කාල පරිච්ඡේදයක දී මෙම වචන පුනරුච්චාරනය කිරීම, අවමඟුලක දී වැලපෙන්නන්ට 'ප්‍රීතිමත් සුභ දවසක් ප්‍රාර්ථනා කිරීම වැනි' යැයි ලෙනින් පිලිතුරු දෙයි. ඒ ආකාරයෙන්ම නිතරම කල නොහැකි බව ඉක්බිතිව ඔහු පෙන්වා දෙයි.

"විප්ලවීය න්‍යාය නොමැතිව විප්ලවීය ව්‍යාපාරයක් තිබිය නොහැකි ය. ඉතාමත් පටු ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ මෝහනයක් සමග අතිනත් ගෙන,

අවස්ථාවාදයේ හැඩකාර දේශනා පැවැත්වීම කෙරෙන මෙවැනි කාලයක, මෙම අදහස කොතරම් අවධාරනය කලත් වැඩි නැත." **(10)** "වඩාත් වැඩිදියුනු න්‍යායෙන් මඟ පෙන්වනු ලබන පක්ෂය" පමනක් ම කම්කරු පන්තියට විප්ලවවාදී නායකත්වය සැපයීමට සමත් වනු ඇතැයි තර්ක කරන ලෙනින්, ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසින් "සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ශ්‍රේෂ්ඨ අරගලයේ ආකෘතීන් දෙකක් නොව තුනක් හඳුනාගත්" බව සිහිපත් කර දෙමින්, "අද අප අතර පවත්නා විලාසිතාව වී ඇති එම අරගලයේ දෙ ආකාර (දේශපාලන හා ආර්ථික) ආකෘතීන් මතු නොවේ. පලමු දෙක සමග සම තත්වයක න්‍යායික අරගලය තැබීමේ වැදගත්කම"එංගල්ස් තේරුම් ගෙන තිබූ බව ලෙනින් සිහිපත් කරයි. **(11)** එංගල්ස්ගේ ප්‍රකාශය ලෙනින් උපුටා දක්වයිඃ "එයට පෙර පැවැති ජර්මානු දර්ශනවාදය, විශේෂයෙන්ම හේගල්ගේ දර්ශනවාදය නොවන්නට එකම විද්‍යාත්මක සමාජවාදය වන ජර්මානු සමාජවාදය, කිසි දිනක බිහි නොවනු ඇත. එමෙන්ම, කම්කරුවන් අතර න්‍යාය පිලිබඳ සංවේදිතාවකින් තොරව මෙම විද්‍යාත්මක සමාජවාදය ඔවුන්ගේ මසට හා ලෙයට කෙදිනකවත් ඇතුලු නොවනු ඇත."**(12)**

"මහජනයාගේ සාංසිද්ධිකතාව (spontaneity) සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සවිඥානකත්වය ලෙස "කල යුත්තේ කුමක් ද?" කෘතියේ දෙවන කොටස නම් කොට තිබේ. මෙය නිසැකව ම ලෙනින්ගේ පොත්පිංචේ වඩාත්ම වැදගත් කොටස වන අතර, නොවැලැක්විය හැකි පරිදි ම, වඩාත් නිර්දය ප්‍රහාරයන්ට හා විකෘති කිරීම්වලට ගොදුරු වූ කොටස ද වෙයි. මෙම කොටස තුල දී වැඩකරන ජනතාව කෙරෙහි පිලිකුල් සහගත වූත්, ඔවුන්ගේ අභිමතාර්ථයන් කෙරේ අවඥාපරවශ වූත්, ඔවුන්ගේ දෛනික අරගලයට සතුරු වූත්, පෞද්ගලික බලය කෙරේ ලොල් වූත් ඔහු සහ ඔහුගේ ශාප ලත් පක්ෂය අයෝමය මුෂ්ඨිත අත්තනෝමතික ආඥාදායකත්වය අව්‍යාජ රුසියානු කම්කරු පන්තිය මත පටවන දිනය ගැන පමනක්ම සිහින දකිමින් සිටින දඩබ්බර ප්‍රභුවාදියෙකු (elitist) ලෙස ලෙනින් තමා ම හෙලිදරව් කරන බව නිරතුරුව ම අපට කියා තිබේ. එබැවින් අප මෙම කොටස සුපරීක්ෂාකාරී ව විමසා බැලීම වටනේ ය.

ලෙනින් විසින් විශ්ලේෂනය කරන ලද වැදගත් ම කරුන වන්නේ, එක්පසෙකින් මාක්ස්වාදය හා විප්ලවවාදී පක්ෂය ද අනෙක් පසින් කම්කරු පන්තියේ සාංසිද්ධික ව්‍යාපාරය හා එම ව්‍යාපාරයේ ගමන්මග තුල කම්කරුවන් අතර වර්ධනය වන සමාජයීය සවිඥානක භාවයේ ආකෘතීන් අතර සම්බන්ධතාවේ ස්වභාවයයි. 1860 ගනන්වල හා 1870 ගනන්වල පන්ති ප්‍රතිවිරෝධතාවන්ගේ ප්‍රාරම්භක අවස්ථාවන්ගෙන් විද්‍යමාන වීම්වලින් පටන් ගෙන, රුසියානු කම්කරුවන් අතර සවිඥානක භාවයේ රූපාකාරයන්හි පරිනාමය පිලිබඳ සලකා බලමින් ඔහු සිය විශ්ලේෂනය ආරම්භ කරයි.

කම්කරුවන් විසින් යන්ත්‍රසූත්‍ර කඩා බිඳ දැමීමේ සිදුවීම් හා බැඳුනු මෙම අරගල, අතිශයින්ම ප්‍රාථමික ස්වභාවයේ ඒවා විය. තම කැරැල්ලේ සමාජ හා පන්ති ස්වභාවය පිලිබඳ අවබෝධයකින් තොරව, අපේක්ෂා භංගත්වය විසින් එලවනු ලැබූ මෙම සාංසිද්ධික නැගී සිටීම මගින් පන්ති විඥානය ප්‍රකට කෙරුනේ එහි "කලල" රූපයෙන් පමනකි. ඉන් දශක තුනකට පසු වර්ධනය වූ තත්වය කැපී පෙනෙන ලෙස වඩාත් උසස් මට්ටමක පැවතියේ ය. කලින් පැවති අරගල සමග සැසඳීමේ දී, 1890 ගනන්වල පැවති වැඩ වර්ජන, කම්කරුවන් අතර සවිඥානක භාවයේ කැපීපෙනෙන සුලු ඉහල මට්ටමක් ප්‍රකට කලේ ය. මෙම වර්ජන වඩාත් සංවිධිත ඒවා විය. ඉදිරිපත් වූ ඉල්ලීම් පවා වඩාත් සවිස්තරාත්මක විය. එතෙකුදු වුවත් කම්කරුවන් විසින් මෙම අරගලයන්හි ලා ප්‍රදර්ශනය කරන ලද්දේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයේ විඥානයකට වඩා වෘත්තීය සමිතිවාදී විඥානයකි. එනම්, මෙම වර්ජන දේශපාලනික ස්වභාවයේ ඉල්ලීම් මතු නො කලේ ය; ඔවුන්ගේ ඉල්ලීම් කම්කරුවන් හා පවත්නා සමාජ-ආර්ථික හා දේශපාලන පර්යාය අතර පවතින ගැටුමේ ගැඹුරු හා සමනය නො කල හැකි ස්වභාවය පිලිබඳ අවබෝධයක් ද ප්‍රදර්ශනය නොකලේ ය. කම්කරුවන් ඒ වෙනුවට තැත් කලේ, පවත්නා සමාජ ක්‍රමයේ රාමුව තුල තමාගේ තත්වය වැඩි දියුනු කර ගැනීමට පමන ය.

මෙම සීමාව නොවැලැක්විය හැකි විය. මක් නිසාද යත්, කම්කරු පන්තියේ සාංසිද්ධික ව්‍යාපාරයට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, එනම්, විප්ලවවාදී, විඥානයක් "සාංසිද්ධිකව", තමා විසින් ම වර්ධනය කර ගැනීමේ හැකියාවක් නොවූ නිසා ය. බොහෝ හෙලා දැකීම්වලට පාත්‍ර වූ තර්කයක් ලෙනින් මතු කරන්නේ මෙතැන දී ය. ඔහු මෙසේ ලියයිඃ

"කම්කරුවන් තුල (නිසගයෙන්) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විඥානය පිහිටා තිබිය නොහැකි වූ බව අපි පවසා ඇත්තෙමු. එය පිටතින් ඔවුන් වෙත ගෙනආ යුතුව ඇත. සෑම රටකම ඉතිහාසය විසින් පෙන්නුම් කෙරෙන්නේ, කම්කරු පන්තියට හුදෙක් තමන්ගේම ප්‍රයත්නයන් මගින් වර්ධනය කර ගත හැක්කේ වෘත්තීය සමිති විඥානය පමනක් බවයි; එනම්, වෘත්තීය සමිති තුල ඒකරාශී වීමේ හාම්පුතුන්ට එරෙහිව සටන් වැදීමේ සහ අත්‍යවශ්‍ය කම්කරු නීති ආදිය ආන්ඩුව ලවා පනවා ගැනීමට පරිශ්‍රම දැරීමේ අත්‍යවශ්‍යතාව පිලිබඳ ඒත්තු ගැනීම දක්වා වන සවිඥානකත්වය යනාදිය යි. කෙසේ වෙතත් සමාජවාදයේ න්‍යාය වර්ධනය වූයේ දේපල හිමි

පන්තීන්හි උගත් නියෝජිතයන් - බුද්ධිමතුන් විසින් විස්තාරනය කරන ලද්දා වූ දාර්ශනික, ඓතිහාසික හා ආර්ථික න්‍යායන් තුලිනි. නූතන සමාජවාදයේ නිර්මාතෘවරයන් වූ මාක්ස් හා එංගල්ස් ද, සිය සමාජ තත්වයෙන් ධනේශ්වර බුද්ධිමතුන්ගේ ගනයට අයත් වෙති. එපරිද්දෙන් ම, රුසියාව තුල සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පැන නැගුනේ ද, කම්කරු පන්ති ව්‍යාපාරයේ සාංසිද්ධික වර්ධනයට මුලුමනින්ම පාහේ ස්වාධීනව ය; එය පැන නැගුනේ, විප්ලවවාදී සමාජවාදී බුද්ධිමතුන් අතර චින්තනයේ වර්ධනයෙහි ස්වාභාවික හා නොවැලැක්විය හැකි ප්‍රතිඵලය ලෙස ය." **(13)**

මාක්ස්වාදය හා කම්කරු පන්තියේ සාංසිද්ධිකව වර්ධනය වන්නා වූ වෘත්තීය සමිතිවාදීන් - එනම්, ධනවාදී විඥ්ඥානය ද අතර සම්බන්ධය පිලිබඳ තමන්ගේ අර්ථකථනයට සහාය පිනිස කාල් කෞට්ස්කිගේ අනුමැතිය සටහන් සහිතව ලෙනින් ඕස්ට්‍රියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කෙටුම්පත් වැඩ පිලිවෙලින් උපුටා දක්වයි.

"ධනවාදයේ වැඩි වර්ධනය විසින් නිර්ධනීන් සංඛ්‍යාවෙන් ඉහල නංවන විට, නිර්ධන පන්තිය වඩවඩාත් ධනේශ්වර ක්‍රමයට එරෙහිව සටන් කිරීමට තල්ලු කෙරෙයි; ඊට අවශ්‍ය ශක්තිය ද ලබයි. සමාජවාදයේ අවශ්‍යතාවය හා එහි ශක්‍යතාව පිලිබඳව නිර්ධන පන්තිය සවිඥ්ඥානක වෙයි. මේ අයුරින් ගත් කල සමාජවාදී සවිඥ්ඥානකත්වය, නිර්ධන පන්ති අරගලයේ අත්‍යවශ්‍ය හා සෘජු ප්‍රතිඵලයක් ලෙස පෙනී යයි. එහෙත් මෙය සහමුලින්ම අසත්‍යය. ඇත්ත වසයෙන් ම, න්‍යායක් ලෙස ගත් කල සමාජවාදයේ මුල් පිහිටා ඇත්තේ ද, නිර්ධන පන්තියේ පන්ති අරගලයේ මුල් පිහිටා ඇති නූතන ආර්ථික සම්බන්ධතා තුල ම ය. පසු කී පන්ති අරගලය මෙන්ම සමාජවාදය ද ධනපති ක්‍රමය විසින් නිර්මිත දරිද්‍රතාවට හා මහජනතාවගේ දුක් පීඩාවන්ට එරෙහි අරගලයෙන් ඉස්මතු වෙයි. එහෙත් සමාජවාදය හා පන්ති අරගලය උරෙන් උර ගැටී නැගී සිටිනු විනා, එකක් අනෙකෙන් ඇති වන්නේ නැත: මේ එක එකක් ඇති වන්නේ වෙනස් කොන්දේසි යටතේය. නූතන සමාජවාදී විඥ්ඥානය පැන නැගිය හැක්කේ ප්‍රගාඪ විද්‍යාත්මක දැනුමක පදනම මත පමනකි. සත්තකින්ම නූතන ආර්ථික විද්‍යාව, (උදාහරනයක් ලෙස,) නූතන තාක්ෂනය තරමට ම සමාජවාදී නිෂ්පාදනය උදෙසා අවශ්‍ය කොන්දේසියක් වෙයි. එසේ කිරීම සඳහා කොතෙක් ආශා කල ද නිර්ධන පන්තියට මේ දෙකින් එකකුදු නිර්මානය නො කල හැකිය. මේ දෙක ම බිහි වනුයේ නූතන සමාජ ක්‍රියාවලියෙනි. විද්‍යාවේ වාහකය නිර්ධන පන්තිය නොව ධනේශ්වර බුද්ධිමතුන් ය. (කාල් කෞට්ස්කිගේ අවධාරනය) : නූතන සමාජවාදය උපත ලද්දේ මෙම සමාජ ස්ථරයේ තනි තනි සාමාජිකයන්ගේ මනස් තුල ය. බුද්ධිමය වසයෙන් වඩාත් දියුනු නිර්ධනීන් වෙත එය සන්නිවේදනය කෙරුනේ මෙම ධනේශ්වර බුද්ධිමතුන් විසිනි. එම වැඩිදියුනු නිර්ධනීහු, පවත්නා කොන්දේසි විසින් ඉඩ හල කල්හි, එය නිර්ධන පන්තියේ පන්ති අරගලය තුලට හඳුන්වා දුන්හ. එනයින්, සමාජවාදී විඥ්ඥානය යනු නිර්ධන පන්ති අරගලයට හඳුන්වා දෙනු ලැබූවක් (von Aussen Hineingretagenē) විනා, එතුලින් සාංසිද්ධිකව ජනනය වූවක් (arwuchsig) නො වේ. ඒ අනුව පැරනි හේන්ෆෙල්ඩ් වැඩ පිලිවෙල ඉතා නිවැරදිව පැවසූයේ සමාජ ප්‍රජාතන්ත්‍රයේ කටයුත්ත වනුයේ (ධනපති ක්‍රමය තුල - පරිවර්තක) ස්වකීය තත්වය පිලිබඳ සවිඥ්ඥානක භාවයෙන් හා ස්වකීය අරමුනු පිලිබඳ සවිඥ්ඥානක භාවයෙන් නිර්ධන පන්තිය පුබුදුවා ලීම (වචනාර්ථයෙන් ම ගත් කල: නිර්ධන පන්තිය සංතෘප්ත කිරීම) බව යි. මෙම විඥ්ඥානය පන්ති අරගලය ඇතුලෙන්ම පැන නැගුනි නම්, එවන් අවශ්‍යතාවක් ඇති නො වේ." (**14**)

මෙම ඡේදයෙන් ලෙනින් පහත දැක්වෙන නිගමන උකහා ගනී:

"කම්කරු ජනතාව විසින් ස්වකීය ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය තුල තමන්ගේ ම ස්වාධීන දෘෂ්ටිවාදයක් ගොඩනගාගැනීම ගැන කථාවක් තිබිය නොහැකි හෙයින්, තෝරා ගැනීමට ඇත්තේ එක්කෝ ධනේශ්වර දෘෂ්ටිවාදය; නැතහොත් සමාජවාදී දෘෂ්ටිවාදය පමනකි. (මිනිස් වර්ගයා විසින් තුන්වැනි දෘෂ්ටිවාදයක් නිර්මානය කොට නැති හෙයින් ද ඊටත් වඩා, පන්ති පසමිතුරුකම්වලින් ඉරී ගිය සමාජයක අපන්තික හෝ පන්තිවලට ඉහලින් පිහිටා සිටින දෘෂ්ටිවාදයක් කිසි විටෙකත් ඇති විය නො විය හැකි හෙයින් ද) මැද මාවතක් නැත. එනයින්, සමාජවාදී දෘෂ්ටිවාදය කවර ලෙසකින් හෝ ලඝු කොට තැකීම, අංශු මාත්‍ර පමනකින් හෝ ඉන් ඉවතට හැරීම යනු ධනේශ්වර දෘෂ්ටිවාදය ශක්තිමත් කිරීමකි. සාංසිද්ධිකතාව පිලිබඳ බෝහෝ කථාබහ ඇසේ. එහෙත් කම්කරු පන්ති ව්‍යාපාරයේ "සාංසිද්ධික" වර්ධනය මග පෙන්වන්නේ ධනපති දෘෂ්ටිවාදයට එය යටත් කිරීම කරා ය; ක්‍රෙඩෝ වැඩ පිලිවෙලේ රේඛා ඔස්සේ එහි වර්ධනය කරා ය. මක් නිසා ද යත්, සාංසිද්ධික කම්කරු පන්ති ව්‍යාපාරය යනු වෘත්තීය සමිතිවාදය යි. එය (it is) Nur – Gewerkschaftlerei යි. වෘත්තීය සමිතිවාදය යනු කම්කරුවන් ධනපති පන්තියේ දෘෂ්ටිවාදයේ වහලුන් බවට පත් කිරීමයි. එබැවින්, අපේ කාර්යය, සමාජ ප්‍රජාතන්ත්‍රයේ කාර්යය, වන්නේ සාංසිද්ධිකතාවයට විරුද්ධව සටන් වැදීම යි; කම්කරු පන්තිය, ඔවුන් ධනේශ්වරයේ පියාපත් යටතට කැඳවා ගෙන යන මෙම සාංසිද්ධික වෘත්තීය සමිතිවාදී ප්‍රයත්නයෙන් ඉවතට හැරවීම යි. ඔවුන් විප්ලවවාදී සමාජ ප්‍රජාතන්ත්‍රයේ පියාපත් යටතට ගෙන ඒම යි."**(15)**

**සටහන්:**

(8) *ලෙනින්, තෝරාගත් කෘති වෙලුම් දොලහ*, 1 වෙලුම, ( මොස්කව්, ප්‍රගති ප්‍රකාශක මන්දිරය 1979), පි. 117-18.

( 9) -එම- පිටු 135-36.

(10) -එම- පි. 136.

(11) -එම- පිටු 137-38.

(12) -එම- පිටු 138.

(13) -එම- පිටු 143.

(14) -එම- පිටු 152-53.

(15) -එම- පිටු 153-54.

© www.wsws.org